**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

**අදියර II විභාගය - 2020 ජූලි**

## (203) ව්‍යාපාර නීතිය
(Business Law)

---

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයෙන්, සමස්ථ විෂය නිර්දේශයම ආවරණය වන පරිදි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව, නීතියේ ප්‍රභේද, වාණිජ නීතිය, කම්කරු නීතිය ආදිය පිළිබඳ අයදුම්කරුවන්ගේ ව්‍යාපාර නීති දැනුම පරීක්ෂා කර තිබුණි.

මෙම ප්‍රශ්නයේ එක් එක් අනු කොටස් සඳහා සිසුන් ලබාදී තිබූ පිළිතුරු අනුව පොදුවේ දක්නට ලැබුණු අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ:

1.3 ජාත්‍යන්තර වෙළඳාමේ භාවිත කරන ගෙවීම් ක්‍රමයක් නොවන්නේ කුමක්ද යන ප්‍රශ්නය සඳහා බොහොමයක් අයදුම්කරුවන් අත්තිකාරම් ගෙවීම ලෙස වැරදියට පිළිතුරු ලබා දී තිබුණි.

1.4 සේවක අර්ථසාධක අරමුදල් පනතෙන් ආවරණය කරනු නොලබන සේවකයන් පිළිබඳ විමසූ මෙම ප්‍රශ්නය සඳහා ද කිහිප දෙනෙක් අනියම් හෝ තාවකාලික සේවකයන් ලෙස වැරදියට පිළිතුරු ලබා දී තිබුණි.

1.5 අයදුම්කරුවන් සුළු ප්‍රතිශතයක් ප්‍රශ්නය සඳහා පාරිතෝෂික ගණනය කිරීම නිවැරදිව කර නොතිබුණි. මෙයට හේතුව වන්නේ, පාරිතෝෂිකය ගණනය පිළිබඳ ඇති නොදැනුවත්භාවයයි. එසේම, ඇතැම් අය අවසාන වැටුප වෙනුවට මුල් වැටුප සැළකිල්ලට ගෙන තිබුණි. එසේම තවත් අය ඔහුගේ සේවා කාලය නිවැරදිව ගණනය කර නොතිබුණි.

1.12 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් කිහිපදෙනෙක් සේවක භාරකාර අරමුදලේ ශේෂය හිමිකම් ලබා ගැනීම සහ පාරිතෝෂික හිමිකම් ලබා ගැනීම පටලවාගෙන වැරදි පිළිතුරු ලබා දී තිබුණි.

ආයෝජන මණ්ඩලයේ කාර්යයන් විමසන 1.10 හා පාරිභෝගික කටයුතු අධිකාරියේ අරමුණු විමසන 1.14 ප්‍රශ්න සඳහා ද සමහර අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලබා දී නොතිබුණි.

නමුත් සමස්තයක් ලෙස ගත්කළ බොහෝ අයදුම්කරුවන් 1.1, 1.7 සහ 1.8 සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. අයදුම්කරුවන් අතරින් බහුතරයක් වෙන් කල ලකුණු ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් ලබා ගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය හවුල් ව්‍යාපාර නීතිය ඇසුරින් අසා තිබුණි. පාදක සිද්ධිය ඇසුරෙන් හවුල්කරුවන්ගේ යුතුකම් පිළිබඳ කරුණු පරීක්ෂා කර ඇත.

සුමනා විසින් ඇයගේ යුතුකම් පැහැර හැරීම සහ පියල්ට මුදල් ලබා ගැනීම සඳහා ඇති හිමිකම පිළිබඳ බොහෝ අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

සමහර අයදුම්කරුවන් නඩු තීන්දු ද ඉදිරිපත් කරමින් පිළිතුරු ඉතාමත් හොඳින් ලියා තිබුණ ද, ඉතා සුළු පිරිසක් පිළිතුරු නිවැරදිව ඉදිරිපත් කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය නියෝජ්‍යත්ව නීතිය ඇසුරින් ඉදිරිපත් වී තිබූ අතර, මෙම ප්‍රශ්නයේදී නියෝජ්‍යත්ව සම්බන්ධතාවයක් ඇති විය හැකි ආකාර මෙන්ම නියෝජිතයන්ගේ වගකීම හා යුතුකම් පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි.

සමස්ථයක් ලෙස අයදුම්කරුවන් බොහෝ පිරිසක් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදිව පිළිතුරු දී තිබුණත් සුළු අයදුම්කරුවන් පිරිසක් කුමුදු සහ මාලක අතර ඇති නියෝජ්‍යත්ව සම්බන්ධතාවය නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

දෙවැනි කොටස සඳහා මාලක විසින් පොඩි බාස් සහ රේණුකා සමඟ ඇතිකර ගන්නා ලද එක් එක් ගිවිසුම යටතේ කුමුදුගේ වගකීම විමසා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා බොහෝ අයදුම්කරුවන් පිරිසක් ඉතා නිවැරදිව කුමුදුගෙන් වන්දි ඉල්ලා සිටිය නොහැකි බවට පිළිතුරු ලබා දී තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය තරමක් සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 04

(A) මෙම ප්‍රශ්නය මඟින් රක්ෂණ නීතියේ දායකත්ව මූලධර්මය පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි. බොහෝ අයදුම්කරුවන් න්‍යායාත්මක දැනුම අවබෝධය සහිතව නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

සමාගම් දෙකෙන්ම රු.500,000/- බැගින් ලබා ගැනීමට හිමිකම් නොමැති බව හඳුනාගෙන තිබුණි. ඒ අතරින් අයදුම්කරුවන් කිහිපදෙනෙක් සමාගම් අතර අනුපාතිකව ගෙවිය යුතු මුදල නිවැරදිව ගණනය කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

(B) මෙම ප්‍රශ්නය කුලී සින්නක්කර ගිවිසුම්වලට අදාලව, න්‍යායාත්මක දැනුම පරීක්ෂා කරන සරල ප්‍රශ්නයකි. ස්ව අධ්‍යයන පාඨමාලා පොත පරිශීලනය කිරීමෙන් පහසුවෙන් පිළිතුරු සැපයිය හැකි එකකි.

අයදුම්කරුවන් කුලී ගැණුම්කරුගේ වගකීම නිවැරදිව හඳුනාගෙන පිළිතුරු ලබා දී අදාල මුළු ලකුණු ලබාගැනීමට සමත් වුවද භාණ්ඩ හිමිකරුගේ වගකීම පිළිබඳව පිළිතුරු ලිවීම සතුටුදායක මට්ටමක නොවීය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 05

**(a)** මෙම ප්‍රශ්නය ගනුදෙනු කළ හැකි ලියවිලි සම්බන්ධයෙන් යොමුකර තිබුණි. චෙක්පත් රේඛනය පිළිබඳවත් ගනුදෙනුකරුවෙකු විසින් අණ කරනු ලැබූ චෙක්පතට ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට බලය ඇති අවස්ථාවන් පිළිබඳවත් දැනුම පරීක්ෂා කර තිබුණි. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්න දෙක සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබුණද "ගනුදෙනු කළ නොහැක" යනුවෙන් රේඛනය කරන ලද චෙක්පතක බලපෑම පිළිබඳ අවබෝධයෙන් තොරව පිළිතුරු ලබා දුන් අයදුම්කරුවන් පිරිසක්ද විය.

කෙසේනමුත්, ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවකට බලය ඇති අවස්ථා සඳහා අයදුම්කරුවන් විසින් ඉතා හොඳින් පිළිතුරු ලබා දී තිබුණි.

**(b)** මෙම ප්‍රශ්නය මගින් කම්කරු නීතිය පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි. මෙම ප්‍රශ්නයට නිවාඩු හිමිකම් ඇති බව බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන තිබුණි. නමුත් දින 84 ක නිවාඩු හිමිකමක් හිමි බව පිළිතුරු ලෙස ලියා තිබුණේ ඉතාමත් ස්වල්ප පිරිසක් පමණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

**(a)** මෙම ප්‍රශ්නය ඍජු න්‍යායාත්මක ප්‍රශ්නයක් වේ. අලුත් ගිණුමක් විවෘත කරන විට මූල්‍ය ආයතනයක් විසින් පුද්ගලයෙකුගෙන් ලබාගත යුතු ලියවිලි වර්ග මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා බොහෝ අයදුම්කරුවන් පිරිසක් හොඳ ලකුණු ප්‍රතිශතයක් ලබා ගෙන තිබුණි.

**(b)** මෙම ප්‍රශ්නය මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත පිළිබඳවත් පරිගණක අපරාධ පනත පිළිබඳවත් දැනුම පරීක්ෂා කර තිබුණි. මෙම න්‍යායාත්මක ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

න්‍යායාත්මක දැනුමෙන් තොරව පිළිතුරු ලියූ සුළු පිරිසක් ද විය .

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## C කොටස

**ප්‍රශ්න අංක 07**

**(A) (a)** ගිවිසුම් නීතිය පදනම් කර ගෙන ප්‍රශ්නය අසා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් අර්පණය, ප්‍රතිග්‍රහණය ආදිය පිළිබඳව නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**(i)** බොහෝ පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණ ද සමහර අයදුම්කරුවන් ප්‍රතිග්‍රහණය පිළිබඳව ප්‍රමාණාත්මකව පිළිතුරු ලියා නොතිබුණි. එම අයදුම්කරුවන් ගිවිසුමක් ඇති බව දැක්වුවද ඒ සම්බන්ධයෙන් කිසිදු න්‍යාය අවබෝධයෙන් තොරව පිළිතුරු ලබා දී තිබුණි. තවද, ගිවිසුමක් ඇති බවට නෛතික කරුණු ඇසුරින් දැක්වීමට ද අසමත් විය.

**(ii)** මෙහිදී බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. නමුත් අයදුම්කරුවන් කිහිප දෙනෙක් පුවත්පතක දැන්වීමක් පළකිරීම අර්පණයට කරන ලද ආරාධනයක් ලෙස වැරදියට පිළිතුරු ලබා දී තිබුණි. නමුත් මෙහිදී සැළකිය යුතුව ඇත්තේ, **විශාකා** විසින් එම දැන්වීම ප්‍රකාරව කටයුතු කර තිබීමය.

**(b)** සමස්තයක් ලෙස ඉතා හොඳින් පිළිතුරු ලබා දී **වෛද්‍යා පෙරේරා** සම්බන්ධයෙන් **බණ්ඩාට** සහ **විශාකාට** ඇති හිමිකම් හා ප්‍රතිකර්ම පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබුණි. ඉහත **(a) කොටසේ** පිළිතුරුවල නිරවද්‍යතාවය මත මෙම පිළිතුරුවල නිරවද්‍යතාවය බොහෝ දුරට රඳා පැවතුණි.

**(B) (a)** භාණ්ඩ විකිණීමේ ආඥා පනත ඇසුරින් **මොහාන්ගේ** නෛතික අයිතිවාසිකම් පිළිබඳව ප්‍රශ්නයෙන් අසා තිබුණි. පනතේ 18 හා 19 වගන්ති පිළිබඳ අයදුම්කරුවන්ගේ න්‍යායික දැනුම සහ නඩු තීන්දු පිළිබඳ දැනුම අඩු බව නිරීක්ෂණය විය. නමුත් මොහාන් විසින් පාඩුව විඳ දරා ගත යුතු බවට බොහෝ අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව පිළිතුරු ලියා තිබුණි.

**(b)** මෙම ප්‍රශ්නයේදී ජෝන්ගේ නෛතික අයිතවාසිකම් පිළිබඳව අයදුම්කරුවන් විසින් නිවැරදිව හඳුනාගෙන තිබු අතර ඉන් සැළකිය යුතු පිරිසක් භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ සඳහන් ව්‍යංග කොන්දේසි පිළිබඳව හොඳින් විග්‍රහ කර පිළිතුරු සපයා තිබුණි

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් සතුටුදායක මට්ටමක විය.**

\- - -

**විභාග අයදුම්කරුවන් ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණුඃ**

(1) නව විෂය නිදේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්න තුළ භාවිත කර ඇති කළයුතු ක්‍රියාව තුලින් බලාපොරොත්තුවන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූලවන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යන පාඩම්මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා ආදිය මැනවින් පරිශීලනය කිරීම

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා අචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක /විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂාකර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -